# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

කේ.එච්.ජී.ආරියතිලක
සිරිකෙත
නා ගහ හන්දිය
කැකණදුර

**<u>අභියාචක</u>**

**අභියාචනා අංකය : 401/2022**

**එදිරිව**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

**<u>පොදු අධිකාරිය</u>**

**ඉදිරිපිටදී :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ආර්. තිලකේෂ්වරී මිය (තොරතුරු නිලධාරි) සහ ආයතන අධ්‍යක්ෂ සාලිය බණ්ඩාර මයා සම්බන්ධ වේ.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය :** 2022.08.17

**තීරණය කළ දිනය :** 2022.08.17

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2021.09.21 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

*මැතිනියනි,*

*2021.03.27 මා විසින් අධ්‍යක්ෂ පාලන එගොඩවෙල මහතාට, අතින් භාර දෙන ලද ලිපියට මෙතෙක් පිළිතුරක් ලැබී නැති බැවින්, අවශ්‍ය කටයුතු කර ගැනීම සදහා මෙම ලිපිය කාරුණිකව ඉදිරිපත් කරමි.*

*1. මා විසින් 202103.27 වෙනි දින පේරාදෙණිය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට පැමිණ, අතින් භාරදෙන ලද ලිපිය භාරගත් අතිරේක අධ්‍යක්ෂ පාලන එගොඩවෙල මහතා- එම ලිපිය සම්පූර්ණයෙන්ම කියවා බලා "විනය නියෝගයේ සඳහන් දඬුවම, මට පමුණුවා තිබියදී නැවතත්, එම දඬුවම පැමිණවීම, වැරදි තීරණයක් බව පිළිගෙන (K H G ආරියතිලක)ට වෙනම ලිපිගොනු කවරයක් පියන්ට කියා ගෙන්වා , ලිපිය සමග මා ඉදිරිපත් කල සියලු තොරතුරු ලිපිගොනුවට ඇතුලත් කරන ලදී.*

*2. මගේ ලිපියේ (5) -ඡේදයේ මා ඉල්ලා ඇත්තේ ආයතන II ප්‍රධාන ලිපිකරු සහ සහකාර අධ්‍යක්ෂ ආයතන කැඳවා ඔවුන් විසින් සිදු කර ඇති වැරදි නිවැරදි කිරීමට කටයුතු කරදෙන ලෙසයි.*

*3. එසේ එකම භූමියක පිහිටා ඇති කාර්යාලවල සේවය කරන ය කැඳවීමට කටයුතු සිදුනොකර වරද නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව මට දන්වා මා ආපසු යවන ලදී.*

*4. එහෙත් මාස 6ක් ගෙවී ඇති බැවින් මෙම ලිපිය අධ්‍යක්ෂ පාලන එගොඩවෙල මහතා ගෙන ඇති ක්‍රියා මාර්ග 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත අනුව කටයුතු කර පිළිතුරක් ලබා දෙන මෙන කාරුණිකව ඉල්ලා සිටිමි.*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුල පිළිතුරු සැපයීමට අපොහොසත් ව ඇති බැවින් අභියාචක විසින් 2021.11.03 දිනැතිව නම් කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත.

මෙයට පිළිතුරු වශයෙන් නම් කළ නිලධාරි විසින් පහත පිළිතුර ලබා දී ඇත.

*<u>2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අනුව තොරතුරු ඉල්ලීම</u>*

*උක්ත කරුණට අදාලව මා වෙත යොමු කල ඔබගේ 2021.11.02 දිනැති අභියාචනා ලිපිය හා බැඳේ.*

*02. ඔබගේ 2021.09.21 දිනැති තොරතුරු ඉල්ලීම සඳහා මාගේ අංක කෘදෙ/ආ/2/1/AGRI/EST/2021/15 හා 2021.10.11 දිනැති ලිපිය මගින් පිළිතුරු ඔබ වෙත යොමු කර ඇත. ඒ අනුව අදාල කරුණ පිලිබඳ දෙපාර්තමේන්තුව සතු ලිපිගොනුව අනුව තොරතුරු පරික්ෂා කිරීමේදී, II, "ආ" ඛණ්ඩයට ලබාදී ඇති උසස්වීම නිඅවරදී බවට නිරීක්ෂණය වන බව කාරුණිකව දන්වමි.*

මෙම පිළිතුරෙන් අතෘප්තියට පත් අභියාචක 2021.12.27 වන දින කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත.

**සළකා බැලීම**

පොදු අධිකාරිය විසින් අද දින ඉදිරිපත් කරන ලද කරුණු අනුව, පොදු අධිකාරියේ නම් කළ නිලධාරි 2021.12.04 දිනැති ලිපිය මගින් ප්‍රතිචාර දක්වා ඇති අතර එකී ප්‍රතිචාරයේ දැක්වෙන අන්දමට 2021.10.11 දිනැති ලිපියෙන්ද ප්‍රතිචාර දැක්වීමක් සිදු කර ඇත. මෙම ප්‍රතිචාරයන් ලැබුණු බවට අභියාචක පිළිගනී. ඒ අනුව උක්ත තොරතුරු ඉල්ලීමේ සඳහන් තොරතුරු අභියාචක වෙත මුදා හැර ඇති බව පැහැදිලිව පෙනී යයි.

අභියාචක අද දින කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කළේ, එකී ලිපි වල සඳහන් අන්දමට පොදු අධිකාරිය එළඹ ඇති තීරණය වැරදි බවය. අභියාචක ඉදිරිපත් කරන මෙම තත්වය හා මැදිහත් වීමට තොරතුරු පනත යටතේ මෙම කොමිෂන් සභාවට හැකියාවක් නොමැත.

ඒ අනුව ප්‍රමාණවත් අයුරින් තොරතුරු සපයා ඇති බවට තීරණය කරමින් මෙම අභියාචනය අවසන් කිරීමට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.